# ආරක්ෂක අමාත්‍යාංශය
# பாதுகாப்பு அமைச்சு
# MINISTRY OF DEFENCE

ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය
தேசிய அனர்த்த நிவாரண சேவைகள் நிலையம்
National Disaster Relief Services Centre
විද්‍යා මාවත, කොළඹ 07, ශ්‍රී ලංකාව
வித்யா மாவத்தை , கொழும்பு 07, இலங்கை
Vidya Mawatha, Colombo 07, Sri Lanka

දු.අ. /தொ.எ / T.N. 0112665258
ෆැක්ස් / பெக்ஸ் / Fax 0112665702
වි.තැ. / மி.அ.மு. / Email sahana.ndrsc@gmail.com


මගේ අංකය / எனது இல / My No. NDRSC/02/04/10

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2026.03.17

ආපදා සහන සේවා මාර්ගෝපදේශ 05/2026

සියලුම දිස්ත්‍රික් ලේකම්වරු,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරු,

<u>ආපදාවෙන් බලපෑමට ලක්වූවන් සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ දීමනා ලබාදීම අදාළ මාර්ගෝපදේශය</u>

“දිට්වා සුළි කුණාටුව” හේතුවෙන් පැන නැඟුණු හදිසි ආපදා තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක්වූ ප්‍රදේශවල බිඳ වැටී ඇති ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම සඳහා, 2025.12.05 දිනැතිව නිකුත් කරනු ලැබූ අයවැය චක්‍රලේඛ අංක 08/2025, 2025.12.20 දිනැතිව නිකුත් කරනු ලැබූ අයවැය චක්‍රලේඛ අංක 08/2025(i) හා 2026.01.22 දිනැතිව නිකුත් කරනු ලැබූ අයවැය චක්‍රලේඛ අංක 08/2025(iii) මඟින් යෝජිත ආපදාවට ලක් වූවන් සවිබල ගැන්වීමේ වැඩසටහනෙහි දක්වා ඇති සහන ලබා දීමේ වැඩසටහන වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීමට අදාල උපදෙස් සහ පැහැදිලි කිරීම් ලබා දීම සඳහා මෙම මාර්ගෝපදේශය නිකුත් කෙරේ.

**02.** අයවැය චක්‍රලේඛ 08/2025, 08/2025(i), 08/2025(iii) යටතේ 2025.12.14, 2025.12.26, 2025.12.29, 2026.01.06, 2026.01.14 හා 2026.01.30 දිනැතිව නිකුත් කරනු ලැබූ මාර්ගෝපදේශ භාවිතයෙන් සිදුකරනු ලැබූ සහන සැලසීමේ කටයුතු කෙරෙහි අගතියක් නොවන පරිදි එම මාර්ගෝපදේශ මින් අවලංගු කරන අතර අයවැය චක්‍රලේඛ මගින් ලබා දී ඇති දීමනාවන් කඩිනමින් ජනතාව වෙත ලබාදීමට අදාළ උපදෙස් හා මාර්ගෝපදේශ සඳහා මෙම මාර්ගෝපදේශය වලංගු වේ.

**03.** නිවාස හා ව්‍යාපාර හානි ගෙවීමේදී 2025 නොවැම්බර් මස 21 වන දින සිට 2025 දෙසැම්බර් මස 15 දින දක්වා පැවැති විස්තීර්ණ ආපදා තත්ත්වය හා ඉන්පසුව ඇති වූ ඊසාන දිග මෝසම් කාලගුණික තත්ත්වය හේතුවෙන් 2025 දෙසැම්බර් මස 31 වන දින දක්වා සිදු වූ සියලු ආපදාවන් අදාළ වේ.

**04.** මෙහි පහත සඳහන් දීමනා ගෙවීමේ දී අවශ්‍ය කරන ලේඛන ආපදාව හේතුවෙන් විනාශ වී ඇත්නම් එම ලේඛන නොමිලේ ලබාදීමට ප්‍රාදේශීය ලේකම් විසින් අදාළ ආයතන හා සම්බන්ධීකරණය වෙමින් සුදුසු වැඩපිළිවෙලක් සකස් කළයුතු වේ. ලේඛන පිළිබඳ මතුවන ගැටලුවලදී, ග්‍රාමීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුව නිර්දේශ මත, ප්‍රාදේශීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුව මඟින් එම ලේඛනවල සහතික කළ පිටපත් හෝ වෙනත් තහවුරු කරගත හැකි ලේඛන අනුව හෝ ලේඛන පසුව ලබාදීමේ පදනම මත ගෙවීම් කළ යුතුය. මෙම මාර්ගෝපදේශය මුදල් , ක්‍රම සම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ හා රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන අමාත්‍යාංශයේ එකඟතාවය අනුව නිකුත් කරන ලදී.

- මෙම දීමනා ලබා දීමේදී, ග්‍රාමීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුවෙහි නිලධාරීන්ට හා ප්‍රාදේශීය ලේකම් වෙත සහාය පිණිස පවතින සංයුතියට අමතරව පහත නිලධාරීන් වෙත ද වගකීම් පවරනු ලැබේ.
    - පරිපාලන ග්‍රාම නිලධාරි
    - සමාජ සේවා නිලධාරි
    - ළමා රක්ෂණ නිලධාරි
    - ළමා හිමිකම් නිළධාරි
    - මුල් ළමාවිය සංවර්ධන නිලධාරි
    - වනිතා සංවර්ධන නිලධාරි
    - වැඩිහිටි හිමිකම් ප්‍රවර්ධන නිලධාරි
    - කර්මාන්ත සංවර්ධන නිලධාරි
    - කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරි
    - ව්‍යවසායකත්ව සංවර්ධන නිලධාරි
    - ඵලදායිතා සංවර්ධන නිලධාරි
    - අපනයන සංවර්ධන නිලධාරි
    - බෞද්ධ කටයුතු සමායෝජක
    - ප්‍රජා සවිබල ගැන්වීමේ නිලධාරි
    - සමෘද්ධි නිලධාරි
    - නිවාස නිලධාරි
    - ඉඩම් නිලධාරි
    - නිවාස සංවර්ධන අධිකාරියේ නියෝජිත
    - නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජිත
    - අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරීන්

- ග්‍රාමීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුවෙහි පවතින කාර්යයන්ට අමතරව පහත කාර්යයන්ද ඇතුළත් කරනු ලැබේ.
    - ආපදාවෙන් බලපෑමට ලක්වූ පාසල් සිසුන්ගේ නාම ලේඛණයක් පවත්වාගෙන යාම, දීමනා ගෙවීම හා නිසි පරිදි පාසල් සිසුන් සඳහා දීමනා ලැබුණු බවට තහවුරු කරගැනීම.
    - හානියට පත් නිවාස පිළිබඳ ලේඛන පවත්වා ගැනීම හා නිවාස හානියට පත් පුද්ගලයින් වෙත නිවාස හානි වන්දි ගෙවීම.
    - ආපදා හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ජනතාවගේ නාම ලේඛන නඩත්තු කිරීම, දීමනා ලබාදීම, අදාළ දීමනා නිසි පරිදි කලට

වේලාවට ප්‍රතිලාභීන් වෙත ලැබුණු බවට තහවුරු කර ගැනීම හා දීමනාව ලබාදීමට අදාළව පැනනගින ගැටළු නිරවුල් කිරීමට කටයුතු කිරීම.

- ආපදා හේතුවෙන් පදිංචි නිවාසවලින් ඉවත් වීමට සිදු වූ ජනතාවගේ නාම ලේඛන නඩත්තු කිරීම, දීමනා ලබාදීම හා අදාළ දීමනා නිසිපරිදි කලට වේලාවට ප්‍රතිලාභීන් වෙත ලැබුණු බවට තහවුරු කරගැනීම.
- දීමනා ලබා ගැනීමට හිමිකම් ලබන ව්‍යාපාර හිමියන් හඳුනාගැනීම සහ තොරතුරු රැස් කිරීම.
- ව්‍යාපාර සඳහා අදාළ දීමනා නිසි පරිදි කලට වේලාවට ප්‍රතිලාභීන් වෙත ලැබුණු බවට තහවුරු කර ගැනීම හා දීමනාව ලබාදීමට අදාළව පැන නගින ගැටළු නිරවුල් කිරීමට කටයුතු කිරීම.

➢ ප්‍රාදේශීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුවෙහි පවතින කාර්යයන්ට අමතරව පහත කාර්යයන්ද ඇතුළත් කරනු ලැබේ

- ආපදා හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ජනතාව වෙත දීමනා ලබාදීමට අදාළව පැනනගින ගැටළු නිරවුල් කිරීමට කටයුතු කිරීම.

➢ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුවෙහි පවතින කාර්යයන්ට අමතරව පහත කාර්යයන්ද ඇතුළත් කරනු ලැබේ.

- නිවාස යථාවත් කිරීම සඳහා ලබාදෙනු ලබන රුපියල් 25,000/-ක දීමනාව හා මුළුතැන්ගෙයි උපකරණ හා අත්‍යාවශ්‍ය ගෘහ උපකරණ මිලදී ගැනීමට ලබාදෙනු ලබන රුපියල් 50,000/-ක දීමනාව ලබාදීමේ දී ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ දී පැන නගින ගැටළු පිළිබඳව අවශ්‍ය තීරණ ප්‍රාදේශීය අවශ්‍යතා ද සැළකිල්ලට ගෙන නිරවුල් කිරීම .
- ආපදා හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ ජනතාව වෙත දීමනා ලබාදීමේදී මතුවන ගැටළු සහගත අවස්ථාවලදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුව වෙත උපදෙස් ලබාදීම.

<u>ලබාදෙනු ලබන දීමනා හා සහන</u>

**05.** **හදිසි ආපදා තත්ත්වය පහව යාමත් සමඟ ආපදාවෙන් බලපෑමට ලක් වූ පවුල්වලට තම නිවස හෝ නව තාවකාලික නවාතැන නැවත පදිංචියට යෝග්‍ය පරිදි පිරිසිදු කර සුරක්ෂිතව පදිංචි වීම සඳහා පදිංචිව සිටි නිවසේ අයිතිය නොසලකා එක් නිවාස ඒකකයකට රුපියල් 25,000/- බැගින් දීමනාවක් ලබාදිය යුතුය.**

## 5.1 මෙම දීමනාව ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම්

2025.11.21 වන දින සිට බලපෑ ආපදා තත්ත්වය මත කිසියම් හෝ ආපදාවක් හේතුවෙන්

- පූර්ණ හානියට පත් වූ නිවාස
- ගංවතුර, පිටාර ජලය, සුළි සුළං, නායයෑම්, කණ්ඩි කඩා වැටීම් හේතුවෙන් අර්ධ හානියට පත් වූ නිවාස
- නිවාස හානියක් සිදු නොවුණ ද ගංවතුර, සුළි සුළං, නායයෑම්, කණ්ඩි කඩා වැටීම් හේතුවෙන් අපිරිසිදු තත්ත්වයකට පත් වූ නිවාස

මෙම දීමනා ලැබීම සඳහා සුදුසුකම් ලබයි.

## 5.2 ඉඩමේ අයිතිය

- මෙම දීමනාව ගෙවීමේදී ඉඩමේ අයිතිය හා ආදායම් මට්ටම නොසලකා දීමනාව ලබාදිය යුතුය. ආපදාවලට ලක් වූ ස්ථිර පදිංචි නිවාස හිමියන්ට, වතු නිවාසවල පදිංචිකරුවන්, කුලී නිවාසවල පදිංචිකරුවන්, අනවසර නිවාසවල පදිංචිකරුවන්, රජයේ නිල නිවාසවල පදිංචිකරුවන් හා රජයේ ලියාපදිංචි ළමා නිවාස, වැඩිහිටි නිවාස හා ආබාධ සහිත තැනැත්තන්ගේ නේවාසික මධ්‍යස්ථානවලටද මෙම දීමනාව ලබාදිය යුතුය.

## 5.3 දීමනාව ලබාදීමේ පදනම

- 2025 නොවැම්බර් මස 21 වන දින සිට බලපෑ ආපදා තත්ත්වයෙන් බලපෑමට ලක්වූ **තනි හෝ සංයුක්ත නිවාස** වෙත පිරිසිදු කර ගැනීමේ කටයුතු සඳහා රුපියල් 25,000/- බැගින් මෙම දීමනාව හානි තක්සේරුවකින් තොරව ලබාදිය යුතුය.

- ඒ අනුව, එක් නිවාස ඒකකයක් තුළ පවුල් හෝ පුද්ගලයින් කිහිප දෙනෙක් පදිංචිව සිටින්නේ නම් නිවාස ඒකකයේ පදිංචි සියලු පවුල් හෝ පුද්ගලයින් අතර මෙම දීමනාව සම සේ බෙදී යා යුතුය.

- කුලී පදනමින් ලබා දී ඇති නිවසකට හිමි දීමනාව කුලී නිවැසියා වෙත පමණක් ලබාදිය යුතුය. පවුල් කිහිපයක් හෝ පුද්ගලයින් කිහිපදෙනෙක් කුලී නිවාසයක ජීවත් වන්නේ නම් එකී පවුල් හෝ පුද්ගලයන් අතර මෙම දීමනාව සමසේ බෙදී යා යුතුය.

- නිවස අයිතිකරුද කුලී නිවැසියන් හෝ පුද්ගලයින් ද සමඟ එකම නිවසක ජීවත් වන්නේ නම් මෙම දීමනාව ඔවුන් අතර ද සමසේ බෙදී යා යුතුය.

- මෙම දීමනාව 2025.11.21 වන දින සිට බලපෑ විස්තීර්ණ ආපදා තත්ත්වය හේතුවෙන් මෙම ආපදා අවස්ථාවට පමණක් බලපාන පරිදි ලබාදෙනු ලබන දීමනාවක් වන බැවින්, එම දීමනාව ආපදාවට පත් වූ සියලුම නිවාස ඒකක

වෙත මුලු මුදල එකවර ගෙවා අවසන් කළ යුතුය. (මෙය අත්තිකාරමක් නොවේ)

### 5.4 දීමනා ඉල්ලුම් කිරීම

- ❖ ප්‍රතිලාභීන් විසින් දීමනා ඉල්ලුම් කරන ලද NDRSC 3.6 අයදුම්පත්‍ර (ඇමුණුම 01) අනුව සකස් කරගත් 3.2.1.(i) Division ආකෘතිය (ඇමුණුම 02) අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙතින් ඉල්ලුම් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය දිස්ත්‍රික් ලේකම් විසින් 3.2.1. (i) District ආකෘතිය (ඇමුණුම
03) හා ප්‍රතිපාදන ඉල්ලීම් ලිපිය මගින් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයෙන් ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතුය.

**06. ආපදාවෙන් බලපෑමට ලක් වූ නිවාසවල නැවත පදිංචියට අවශ්‍ය මුළුතැන්ගෙයි බඩු මුට්ටු, අත්‍යාවශ්‍ය ගෘහ උපකරණ ආදිය මිලට ගැනීම සඳහා නිවසේ අයිතිය නොසලකා සංයුක්ත නිවාස ඒකකයකට රුපියල් 50,000/- බැගින් දීමනාවක් ලබාදිය යුතුය.**

### 6.1 මෙම දීමනාව ඉල්ලුම් කිරීම සඳහා සුදුසුකම්

2025.11.21 වන දින සිට බලපෑ ආපදා තත්ත්වය මත කිසියම් හෝ ආපදාවක් හේතුවෙන්

- ➢ පූර්ණ හානියට පත් වූ නිවාස
- ➢ ගංවතුර, පිටාර ජලය, සුළි සුළං, නායයෑම්, කණ්ඩි කඩා වැටීම් හේතුවෙන් අර්ධ හානියට පත් වූ නිවාස
- ➢ ගංවතුර, පිටාර ජලය, සුළි සුළං, නායයෑම් හා කණ්ඩි කඩාවැටීම් හේතුවෙන් මුළුතැන්ගෙයි උපකරණ හා අත්‍යවශ්‍ය ගෘහ භාණ්ඩ හානියට පත් වූ නිවාස

### 6.2 ඉඩමේ අයිතිය

- ❖ මෙම දීමනා ගෙවීමේදී ඉඩමේ අයිතිය හා ආදායම් මට්ටම නොසලකා දීමනාව ලබාදිය යුතුය. ආපදාවලට ලක් වූ ස්ථිර පදිංචි නිවාස හිමියන්ට, වතු නිවාසවල පදිංචිකරුවන් , කුලී නිවාසවල පදිංචිකරුවන්, අනවසර නිවාසවල පදිංචිකරුවන්, රජයේ නිල නිවාසවල පදිංචිකරුවන් හා රජයේ ලියාපදිංචි ළමා නිවාස, වැඩිහිටි නිවාස හා ආබාධ සහිත තැනැත්තන්ගේ නේවාසික මධ්‍යස්ථානවලටද මෙම දීමනා ලබාදිය යුතුය.

### 6.3 දීමනා ලබාදීමේ පදනම

2025 නොවැම්බර් මස 21 වන දින සිට බලපෑ ආපදා තත්ත්වයෙන් බලපෑමට ලක්වූ නිවාස ඒකකයෙහි මුළුතැන්ගෙයි උපකරණ හා අත්‍යාවශ්‍ය ගෘහ උපකරණ මිලදී ගැනීම සඳහා රුපියල් 50,000/- බැගින් ලබාදිය යුතුය.

- ඒ අනුව, එක් නිවාස ඒකකයක් තුළ පවුල් හෝ පුද්ගලයින් කිහිප දෙනෙක් පදිංචිව සිටින්නේ නම් නිවාස ඒකකයේ පදිංචි සියලු පවුල් හෝ පුද්ගලයින් අතර මෙම දීමනාව සම සේ බෙදී යා යුතුය.

- කුලී පදනමින් ලබා දී ඇති නිවසකට හිමි දීමනාව කුලී නිවැසියා වෙත පමණක් ලබාදිය යුතුය. පවුල් කිහිපයක් හෝ පුද්ගලයින් කිහිපදෙනෙක් කුලී නිවාසයක ජීවත් වන්නේ නම් එකී පවුල් හෝ පුද්ගලයන් අතර මෙම දීමනාව සමසේ බෙදී යා යුතුය.

- නිවස අයිතිකරුද කුලී නිවැසියන් හෝ පුද්ගලයින් ද සමඟ එකම නිවසක ජීවත් වන්නේ නම් මෙම දීමනාව ඔවුන් අතර ද සමසේ බෙදී යා යුතුය.

### 6.4 දීමනා ඉල්ලුම් කිරීම

- ප්‍රතිලාභීන් විසින් දීමනා ඉල්ලුම් කරන ලද NDRSC 3.7 අයදුම්පත්‍ර (ඇමුණුම 04) අනුව සකස් කරගත් 3.2.1.(ii) Division ආකෘතිය (ඇමුණුම 05) අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙතින් ඉල්ලුම් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය දිස්ත්‍රික් ලේකම් විසින් 3.2.1. (ii) District ආකෘතිය (ඇමුණුම 06) හා ප්‍රතිපාදන ඉල්ලීම් ලිපිය මගින් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයෙන් ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතුය.

- නිවාස යථාවත් කිරීම සඳහා ලබාදෙනු ලබන රුපියල් 25,000/-ක දීමනාව හා මුළුතැන්ගෙයි උපකරණ හා අත්‍යාවශ්‍ය ගෘහ උපකරණ මිලදී ගැනීමට ලබාදෙනු ලබන රුපියල් 50,000/-ක දීමනාව ලබාදීමට අදාළ ප්‍රතිලාභී නාමලේඛන ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත යොමු කළ යුතුය.

- මෙම සියලු නාම ලේඛණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රදර්ශනය කළ යුතුය.

- මෙම රුපියල් 25,000/- හා රුපියල් 50,000/- දීමනා ලබාදීමේ දී ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ දී පැන නගින ගැටළු පිළිබඳව අවශ්‍ය තීරණ ප්‍රාදේශීය අවශ්‍යතා ද සැලකිල්ලට ගෙන දිස්ත්‍රික් ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුව මගින් නිරවුල් කරගත යුතුවේ. එම තීරණ අවසන් තීරණ ලෙස සැලකේ.

07. නායයෑම් හා ගංවතුර හේතුවෙන් තම පදිංචි නිවස අහිමි වූ හෝ නිවස පූර්ණ ලෙස හානිවීම හේතුවෙන් ජීවනෝපාය කටයුතුවල අඛණ්ඩව නිරත වීමට නොහැකි පවුල් වෙත ගෙවනු ලබන දීමනාව

- ආපදාවෙන් බලපෑමට ලක්වීම හේතුවෙන් තම පදිංචි නිවස අහිමි වූ හෝ නිවස පූර්ණ ලෙස හානිවීම හේතුවෙන් සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් අවදානම් ලෙස හඳුනාගත් පදිංචියට නුසුදුසු ලෙස නිර්දේශ කිරීම හේතුවෙන් ජීවනෝපාය කටයුතුවල අඛණ්ඩව නිරතවිය නොහැකි පවුල් සඳහා පමණක් මෙම දීමනාව හිමි වේ.
- කුලී නිවෙස්වල හා රක්ෂිත භූමිවල (අනවසර) පදිංචිව සිට ආපදාවෙන් බලපෑමට ලක්වීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වූවන් ද මේ සඳහා හිමිකම් ලබයි.

7.1 මෙම දීමනාව පවුලේ සාමාජික සංඛ්‍යාව අනුව පහත පරිදි මාස 03ක කාලයක් සඳහා ලබාදිය යුතුය.

(අ) සාමාජිකයින් සංඛ්‍යාව 02 හෝ ඊට අඩු පවුල් සඳහා - මසකට රුපියල් 25,000/-
(ආ) සාමාජිකයින් සංඛ්‍යාව 02ට වැඩි පවුල් සඳහා - මසකට රුපියල් 50,000/-

- මෙම දීමනාව 2025 දෙසැම්බර් හා 2026 ජනවාරි හා පෙබරවාරි මාස සඳහා තනි හෝ සංයුක්ත නිවාසවල ජීවත් වූ පවුල් වෙත වෙන් වෙන්ව රුපියල් 25,000/- බැගින් මාස 03ක් සඳහා ගෙවනු ලබන මාසික දීමනාවකි.

- දීමනාව ලබාදීමට අදාළව පැනනගින ගැටළු ප්‍රාදේශීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුව මගින් නිරවුල් කරගත යුතුය.

- එසේ නිරවුල් කරගත නොහැකි අවස්ථාවලදී දිස්ත්‍රික් ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුව වෙත යොමු කර උපදෙස් ලබාගැනීම සුදුසු වේ.

7.2 මෙම දීමනාව පවුලේ ගෘහ මූලිකයා වෙත නිදහස් කළ යුතුය.

- ප්‍රතිලාභීන් විසින් සම්පූර්ණ කරන ලද 2.6 අයදුම්පත්‍ර (ඇමුණුම 07) අනුව සකස් කරගත් 2.6.1 Division ආකෘතිය (ඇමුණුම 08) අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙතින් ඉල්ලුම් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය දිස්ත්‍රික් ලේකම් විසින් 2.6.1 District ආකෘතිය (ඇමුණුම 09) හා ප්‍රතිපාදන ඉල්ලීම් ලිපිය මගින් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයෙන් ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතුය.

**08.** **ආපදාවෙන් බලපෑමට ලක්වූ පාසල් සිසුන්ට පොත්පත් සහ ඇඳුම් පැළඳුම් මිලදී ගැනීම සඳහා එක්වරක් පමණක් ලබාදෙන දීමනාවක් ලෙස එක් පාසල් දරුවෙකුට රුපියල් 15,000/- බැගින් දීමනාවක් ලබාදිය යුතුය.**

**8.1** ග්‍රාම නිලධාරි ඇතුළු නිලධාරි කමිටුවේ නිර්දේශ ඇතුළත් ආකෘතිය 2.7 අයදුම්පත්‍ර (ඇමුණුම 10) අනුව සකස් කරගත් 2.7.1 (Division) ආකෘතිය (ඇමුණුම 11) මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙතින් ඉල්ලුම් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය 2.7.1 (District) ආකෘතිය (ඇමුණුම 12) හා ප්‍රතිපාදන ඉල්ලීම් ලිපිය මගින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙතින් ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතුය.

**8.2** දීමනා මුදල් ලබාදෙන ලද ප්‍රතිලාභී නාමලේඛන ජාතික ආපදා සේවා මධ්‍යස්ථානය වෙත යොමු කළ යුතුය.

**09.** **නායයෑම්, ගංවතුර හෝ වෙනත් ස්වභාවික ආපදා තත්ත්වයක් හේතුවෙන් තම නිවස අහිමි වී පදිංචි වීමට නිවසක් නොමැති නිවාස හිමියන් සඳහා නව නිවසක් ඉදිකර ගන්නා තෙක් වෙනත් ස්ථානයක තාවකාලිකව පදිංචි වීම සඳහා මසකට රුපියල් 25,000/- බැගින් උපරිමය මාස 06ක් දක්වා මාසික කුලී දීමනාවක් ලබාදිය යුතුය.**

- ආපදාවට ලක්වීම හේතුවෙන් නිවස පූර්ණ හානියට පත් වීමෙන් තම පදිංචි නිවස අහිමි වී පදිංචි වීමට නිවසක් නොමැති නිවාස හිමියන් සඳහා නව නිවසක් ඉදිකර ගන්නා තෙක් වෙනත් ස්ථානයක තාවකාලිකව පදිංචි වීමට මෙම කුලී නිවාස දීමනාව හිමි වේ.
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් අවදානම් ලෙස හඳුනාගත් පදිංචියට නුසුදුසු ලෙස නිර්දේශ කර ඇති නිවාස හිමියන් සඳහාද මෙම දීමනාව හිමි වේ.

- මෙය කුලී නිවැසියන් සඳහා ගෙවනු නොලබන අතර පදිංචි නිවස පූර්ණ හානියට පත්වීම හෝ පදිංචි භූමිය අධි අවදානම් බවට පත්වීම හේතුවෙන් ජීවිත සුරක්ෂිතතාවය ඇතිකළ යුතු බැවින් රක්ෂිතයන්හි පදිංචිකරුවන්ට , වැවිලි සමාගම්වලට අයත් වතු නිවාසවල පදිංචිකරුවන්ට හා පෞද්ගලික වතුවල පදිංචිකරුවන්ට ද මෙම දීමනාව හිමි වේ.

- දිට්වා අපදා තත්ත්වයට පෙර අධි අවදානම් ලෙස නම්කර තිබියදී එම අවදානම් ස්ථානවලින් ඉවත් නොවී සිටියද ඉවත් නොවන බවට දිවුරුම් ප්‍රකාශ ලබා දී තිබුණ ද මෙය සුවිශේෂී අවස්ථාවක් සේ සලකා දිට්වා ආපදාවට ලක් වූ එම පවුල් වෙතද මෙම රු.25,000/- දිමනාව හිමිගැන්විය යුතුය.

- ස්ථිර පදිංචිව සිටි නිවස සඳහා පමණක් හිමිවන මෙම දීමනාව එක් පවුලක් සඳහා එක් නිවසකට පමණක් ගෙවනු ලබන දීමනාවකි. ස්ථිර පදිංචි නිවසකට අමතරව එම පුද්ගලයා සතු හානියට පත් වූ අනෙකුත් නිවාස සඳහා මෙම දීමනාව ගෙවනු නොලැබේ.

- නිවාස කුලී දීමනාව ඉල්ලුම් කර ප්‍රතිලාභීන් විසින් සම්පූර්ණ කරන ලද ආකෘතිය 2.8 අයදුම්පත්‍ර (ඇමුණුම 13) අනුව සකස් කරගත් 2.8.1 (Division) ආකෘතිය (ඇමුණුම 14) මගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙතින් ඉල්ලුම් කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමාණය 2.8.1 (District) ආකෘතිය (ඇමුණුම 15) හා ප්‍රතිපාදන ඉල්ලීම් ලිපිය මගින් දිස්ත්‍රික්

ලේකම් කාර්යාල විසින් ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙතින් ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතුය.

- නිවාස කුලී දීමනා මුදල් ලබාදෙන ලද ප්‍රතිලාභී නාමලේඛන ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය වෙත යොමු කළ යුතුය.

## 10. ආපදා බලපෑම හේතුවෙන් සිදුවූ ජීවිත හානි වෙනුවෙන් සහ පූර්ණ ආබාධිත තත්ත්වයකට පත්වීමකදී අදාල වන ගෙවීම්

අංක 08/2025 දරන 2025.12.05 දිනැති අයවැය චක්‍රලේඛයේ වගුවේ අනු අංක 15 යටතේ දක්වා ඇති පරිදි ආපදා තත්ත්වය හේතුවෙන් සිදු වූ පූර්ණ ආබාධිත තත්ත්වයකට පත්වීමකදී අදාළ පුද්ගලයා වෙත රු. 1,000,000/-ක දීමනාවක් ලබා දිය යුතුය.

### 10.1. ආපදා බලපෑම හේතුවෙන් සිදු වූ ජීවිත හානි සඳහා දීමනා ගෙවීම.

**10.1.1** ආපදා තත්ත්වය හේතුවෙන් සිදු වූ ජීවිත හානියක දී මියගිය පුද්ගලයා සමඟ එකම නිවසේ ජීවත් වූ අය අතුරින් ජීවත්ව සිටින ළගම ඥාතියා වෙත මරණ සහතිකයේ පිටපතක් ලබාගෙන රු. 1,100,000/-ක දීමනාවක් ලබා දීම.

**10.1.2** අවමංගල්‍ය කටයුතු සිදු කිරීම වෙනුවෙන් ළගම ඥාතියකු කටයුතු කරන අවස්ථාවකදී රු. 100,000/- ක දීමනාවක් ඔහු වෙත ප්‍රාදේශීය ලේකම් විසින් ලබා දිය යුතුය.

**10.1.3** ආපදාවකදී එකම නිවසේ සිටින සියලු දෙනාම, ආපදාව හේතුවෙන් මියගිය විට ඔවුන්ගේ අවසන් කටයුතු සිදු කිරීමට කිසියම් සංවිධානයක් හෝ පුද්ගලයෙකු කටයුතු නොකරන විටක රජයේ පූර්ණ අනුග්‍රහයෙන් ප්‍රාදේශිය ලේකම් විසින් එම අවසන් කටයුතු සිදු කල යුතු අතර, කිසිවෙකුට මරණ වන්දි හිමි නොවේ.

**10.1.4** අතුරුදහන් වුවන් සම්බන්ධයෙන් පවතින නීති අනුව, මරණ සහතිකය නිකුත් කල පසුව ඉහත පරිදි එකම නිවසේ ජීවත් වූ අය අතුරින් ජීවත්ව සිටින ළගම ඥාතියකු සිටින්නේ නම්, ඔහු වෙත මරණ වන්දිය ගෙවිය යුතුය.

**10.1.5** මෙම ගෙවීම් කඩිනමින් ලබාදීමට අවශ්‍ය ලේඛන ලබාදීමේ වැඩපිළිවෙලක් රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් සකස් කළ යුතුය.

### 10.2 ජීවිත හානි වන්දි අයදුම් කිරීම සඳහා අවශ්‍ය ලේඛන

- සම්පූර්ණ කරන ලද ජිවිත හානි වන්දි අයදුම් පත්‍රය (NDRSC 2.1 ආකෘතිය)
- ආපදා සිදුවීමට අදාළ ආපදා සිද්ධි වාර්තාව (NDRSC 1.1 ආකෘතිය)
- ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය
- මියගිය පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික කළ පිටපත
- මියගිය පුද්ගලයාගේ මරණ සහතිකයෙහි සහතික කළ පිටපත

- නීතිමය උරුමකරුවන්ගේ ඥාතීත්වය සනාථ කිරීමට අදාළ ලේඛනවල සහතික කළ පිටපත් (උදා:- උප්පැන්න සහතිකය, විවාහ සහතිකය, දිවුරුම් ප්‍රකාශය)

## 10.3 ආපදා බලපෑම හේතුවෙන් පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වීමකදී දීමනා ගෙවීම.

පූර්ණ ආබාධිත තත්ත්වයකට පත්වීමකදී අදාළ පුද්ගලයා වෙත රු. 1,000,000/-ක දීමනාවක් ලබා දීම සිදු කළ යුතුය.

**10.3.1** දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී ඇතුළු වෛද්‍ය මණ්ඩලයේ වෛද්‍ය වාර්තාව හා පහත ලේඛන සමඟ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කරනු ලබන අයදුම්පත්‍ර අනුව සකස් කළ ප්‍රතිපාදන ඉල්ලීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත යොමු කළයුතු අතර එම ඉල්ලීම අනුව දිස්ත්‍රික් ලේකම් විසින් යොමු කරනු ලබන ප්‍රතිපාදන ඉල්ලීම් අනුව ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ප්‍රතිපාදන නිදහස් කරනු ලැබේ.

### 10.3.2 පූර්ණ ආබාධිත වන්දි අයදුම් කිරීම සඳහා අවශ්‍ය ලේඛන

- පූර්ණ ආබාධිත වන්දි හිමිකම් අයදුම්පත්‍රය ((NDRSC 2.1 ආකෘතිය)
- ආපදා සිදුවීමට අදාළ ආපදා සිද්ධි වාර්තාව (NDRSC 1.1 ආකෘතිය)
- ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය
- පූර්ණ ආබාධිත පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පතෙහි සහතික කළ පිටපත
- පූර්ණ ආබාධිත පුද්ගලයාගේ බැංකු ගිණුම් පාස් පොතෙහි මුල් පිටුවෙහි සහතික කළ පිටපත
- පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වීම මත වන්දි අයදුම් කිරීමේ දී අදාළ වෛද්‍ය මණ්ඩලයේ සහතිකය (අනිවාර්යය වේ)

## 11. ආපදා බලපෑම හේතුවෙන් හානි වූ නිවාස ඉදිකිරීම සහ නායයෑම් අධි අවධානම් නිවාස වෙනුවෙන් දීමනා ගෙවීම

**11.1** 2025 නොවැම්බර් මස 21 වන දින සිට 2025 දෙසැම්බර් මස 15 දින දක්වා පැවැති විස්තීර්ණ ආපදා තත්ත්වය හා ඉන්පසුව ඇති වූ ඊසාන දිග මෝසම් කාලගුණික තත්ත්වය හේතුවෙන් 2025 දෙසැම්බර් මස 31 වන දින දක්වා සිදු වූ සියලු ආපදාවන් හේතුවෙන් නිවාස හානියට පත් වූ පුද්ගලයින් වෙනුවෙන් වන්දි ගෙවීම මෙහිදී අදාළ වේ.

**11.2** මෙහි පහත සඳහන් දීමනා ගෙවීමේ දී අවශ්‍ය කරන ලේඛන ආපදාව හේතුවෙන් විනාශ වී ඇත්නම් එම ලේඛන නොමිලේ ලබාදීමට ප්‍රාදේශීය ලේකම් විසින් අදාළ ආයතන හා සම්බන්ධීකරණය වෙමින් සුදුසු වැඩපිළිවෙලක් සකස් කළයුතු වේ.

**11.3** ලේඛන පිළිබඳ මතුවන ගැටලුවලදී, ග්‍රාමීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුව නිර්දේශ මත, ප්‍රාදේශීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුව

මඟින් එම ලේඛනවල සහතික කළ පිටපත් හෝ වෙනත් තහවුරු කරගත හැකි ලේඛන අනුව හෝ ලේඛන පසුව ලබාදීමේ පදනම මත ගෙවීම් කළ යුතුය.

**11.4** ජනතාව වෙත දීමනා ලබාදීමේ දී මතුවන ගැටළු සහගත අවස්ථාවල දී ග්‍රාමීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුව හරහා ප්‍රාදේශීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුව සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුව වෙත යොමු කොට උපදෙස් ලබාගත යුතු අතර, ඒ අනුව අවශ්‍ය තීරණවලට එළඹිය යුතුය.

### 11.5 නිවාස හානි නිර්වචනය කිරීම

#### 11.5.1 පූර්ණ නිවාස හානි

ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් ලබාදෙන පහත නිර්වචනය අනුව පූර්ණ නිවාස හානි හඳුනා ගැනේ.

- මුළු ගොඩනැගිල්ලෙන් 65% ක් සහ ඊට වඩා වැඩි ප්‍රමාණයකට හානි සිදු වී ඇතිනම් එම ගොඩනැගිල්ල පූර්ණ හානි වූ ලෙස සැලකේ.
- ආපදාවෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශවල නායයෑම් අධි අවධානම් බව හේතුවෙන් පදිංචියට නුසුදුසු බවට ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ ලබා දී ඇති නිවාස
- ඉහත සඳහන් ඇති නිර්ණායකයට අමතරව ගොඩනැගිල්ලට සිදු වී ඇති හානි වර්ගීකරණය සිදු කිරීමේදී පහත වගුවෙහි සඳහන් එක් කරුණක් හෝ සපුරන්නේ නම් එම ගොඩනැගිල්ල පූර්ණ ලෙස හානිවූ ගොඩනැගිල්ලක් ලෙස වර්ගීකරණය සිදු කළ හැකිය.

| දර්ශකය | ඇගයීමේ ක්‍රමවේදය සහ සීමාවන් | |
|---|---|---|
| පාදම්/අත්තිවාරම් හානි (Foundation Damage/Settlement) | • දෘශ්‍ය ඉරිතැලීම්,<br>• අත්තිවාරමට යටින් පාංශු ඛාදනය වීම (Soil Erosion)<br>• අසමතුලිත ගිලා බැසීම් හේතුවෙන් ඇතිවන ඉරිතැලීම්<br>• බිත්ති සහ කොන්ක්‍රීට් ව්‍යුහයන් ආනත/ඇල වීම<br>• දොර සහ ජනේල් රාමු තද වීම<br>• ජල ප්‍රවාහය හෝ නායයෑම් හේතුවෙන් ආධාරක අහිමි වීම<br>• බැවුම් මත පිහිටි නිරාවරණය වූ හා අස්ථාවර ලෙස දෘශ්‍ය වන අත්තිවාරම් | • අත්තිවාරම සම්පූර්ණ දිගින් 40% කට වඩා බලපෑමට ලක්වීම,<br>• > මි.මී. 25 ආනත/ඇල වීම හෝ ඉරිතැලීම් වේගයෙන් වැඩි වීම |

| දර්ශකය | ඇගයීමේ ක්‍රමවේදය සහ සීමාවන් | |
|---|---|---|
| බර දරා ගැනීමේ බිත්ති (Load Bearing Walls) | • බිත්ති ඉරිතැලීම් හෝ පිපිරීම්<br>• දොර සහ ජනේල් රාමු තද වීම | • බර දරා ගැනීමේ හැකියාවෙන් 35%කට වඩා අඩුවීම |
| ආනතවීම (tilt/ Out-of-Plumb) | • ගොඩනැගිල්ල ආනත/ඇල වීම<br>• (බිත්ති හෝ කුළුණු මඟින්) | • උපරිම සීමාව (Ultimate Limit) 1/150 (0.0067) |
| කොන්ක්‍රීට් ව්‍යුහයන්ගේ අවදානම් ව්‍යුහාත්මක ඉරිතැලීම් (Severe Structural Cracks on RCC Elements) | • ඉරිතැලීම් හෝ පිපිරීම් තවදුරටත් පුළුල්වීම<br>• වැර ගැන්වූ කොන්ක්‍රීට් ව්‍යුහයන් සඳහා > මි.මී. 0.3 ඉරිතැලීම් හෝ පිපිරීම්<br>• ව්‍යුහයන්ගේ සම්බන්ධවීම් බිඳී යාම<br><br>මේ සඳහා ව්‍යුහාත්මක ඉංජිනේරුවරයෙකුගේ උපදෙස් ලබා ගත යුතුවේ. | |
| නායයෑම් බලපෑම් (Landslide Interaction) | • පසුපස හෝ ඉදිරි බෑවුම් චලනය/බිඳවැටීම්,<br>• ආධාරක බැම් ඉරිතැලීම් / බිඳ වැටීම්,<br>• ඕනෑම ක්‍රියාකාරී භූමි චලනයක්,<br>• පොළවෙහි ආතති පැළුම් ඇතිවීම,<br>• කන්ඩි කඩා වැටීම<br>මේ සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශ ලබා ගත යුතුවේ.<br>• පදිංචියට නුසුදුසු බවට ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ ලබා දී ඇති නිවාස | • තවදුරටත් පොළවෙහි හෝ ගොඩනැගිල්ලේ ඉරිතැලීම් ඇති වීම |

- ගොඩනැගිල්ලක/ගොඩනැගිල්ලේ කොටසක තිරස් සහ සිරස් මට්ටම් සහ ගිලා බැස්ම (Settlement) උපරිම සීමාව 1/150 (0.0067) ඉක්මවා යන්නේ නම් එම ගොඩනැගිල්ල /එම කොටස පූර්ණ හානි ලෙස සැලකිය හැකිය.

- ගොඩනැගිල්ලකට සිදුවී ඇති හානි ප්‍රමාණය නිර්ණය කිරීමේ දී පහත සඳහන් දළ ප්‍රතිශතයන් සැලකිල්ලට ගත හැකිය. අවසන් අනුමැතිය සම්බන්ධයෙන් තීරණ ගැනීමේ පූර්ණ බලය ප්‍රාදේශීය කමිටුව සතු වේ.

බර දරා ගැනීමේ බිත්ති සහිත ගොඩනැගිලි

| ගොඩනැගිලි අංගය | ගොඩනැගිල්ලේ මුළු වටිනාකමින් දළ ප්‍රතිශතයන් |
|---|---|
| අත්තිවාරම් හා බර දරා ගැනීමේ බිත්ති | 70% |
| වහලය | 15% |
| විදුලි ( Electrical System) | 10% |
| පොළව | 5% |
| එකතුව | 100% |

කොන්ක්‍රීට් ව්‍යුහය සහිත ගොඩනැගිලි

| ගොඩනැගිලි අංගය | ගොඩනැගිල්ලේ මුළු වටිනාකමින් දල ප්‍රතිශතයන් |
|---|---|
| අත්තිවාරම් හා වරගැන් වූ කොන්ක්‍රීට් | 40% |
| බිත්ති (with finishes) | 35% |
| වහලය | 10% |
| විදුලි ( Electrical System) | 10% |
| පොලව | 5% |
| එකතුව | 100% |

➤ ආපදාවන්ට ඔරොත්තු නොදෙන කටුමැටි හා ලෑලි වැනි තාවකාලික අමුද්‍රව්‍ය යොදා සකස් කළ නිවාස දිට්වා සුළි කුණාටුව හේතුවෙන් හානියට පත් වූයේ නම්, මෙවැනි නිවෙස්වලට සිදුවන ආපදා වෙනුවෙන් වරින් වර වන්දි ලබාදීම ප්‍රතිඵලදායක හා ආර්ථික පිරිමැසුම්දායක නොවන බැවින් එම නිවාස නැවත නැවත ආපදාවට ලක්වීම වළක්වාලීම සඳහා මෙම නිවාස ආපදා ප්‍රත්‍යස්ථිකව නැවත ස්ථිර අමුද්‍රව්‍ය යොදා ඉදි කළයුතු බැවින් එවැනි තාවකාලික අමුද්‍රව්‍ය යෙදූ නිවාස සඳහා වන හානි ද **පූර්ණ හානි ලෙස සලකනු ලැබේ.**

## 11.5.2 අර්ධ නිවාස හානි

පූර්ණ නිවාස හානි ලෙස දැක්විය නොහැකි, ගොඩනැගිල්ලෙන් 65% කට වඩා අඩු ප්‍රමාණයකට හානි සිදු වී ඇති අවස්ථාවක එම හානිය අර්ධ නිවාස හානියක් ලෙස සැලකේ. එම නිවාස ප්‍රතිසංස්කරණය කර ජීවත්වීමට සුදුසු ලෙස සැලකේ.අර්ධ හානි අවස්ථා නිර්ණය කිරීමේදී පහත කරුණු ද සැලකිල්ලට ගත හැකිය.

- බර උසුලන කණු හෝ ව්‍යුහාත්මක මූලද්‍රව්‍ය බිඳවැටීමක් නොමැත.
- සමස්ත ව්‍යුහාත්මක ස්ථායිතාවයට හානියක් නොවන බර දරණ මූලද්‍රව්‍ය ඒකක, එනම් කණු හෝ බාල්කවලට හානියක් සිදු වී නොතිබීම.
- ප්‍රාථමික ව්‍යුහයට බලපාන්නේ නැති සුළු ඉරිතැලීම් පැවතීම

වහලය සහ ආවරණය

- වහලයට හානිවීම
- ස්ථායිතාවයට හානියක් නොවන බිත්ති හානිවීම
- දොරවල්/ ජනෙල්වලට හානි සිදු වී තිබුණද නිවස සුරක්ෂිත කළහැකිවීම
- සනීපාරක්ෂක පහසුකම් අහිමි වීම
- විදුලි පද්ධතිය අනාරක්ෂිත හෝ විනාශ වීම

- සම්පූර්ණයෙන්ම හානි වූ කාණ්ඩය යටතේ ඇතුළත් කර නොමැති ඕනෑම අමතර හානි අර්ධ හානි ලෙස සැලකේ.

## 11.6 පූර්ණ නිවාස හානි සඳහා නව නිවසක් ඉදි කිරීමට දීමනා ලබා දීම

දිට්වා සුළි කුණාටුව හේතුවෙන් නායයාමට ලක්ව හානි වූ නිවාස හෝ නායයෑම් අධි අවදානම හේතුවෙන් නැවත පදිංචි කළයුතු වන නිවාස හා ගංවතුර හෝ වෙනත් ආපදාවක් හේතුවෙන් පූර්ණ හානි වූ නිවාස යළි ඉදිකර ගැනීම පිණිස රු.5,000,000/-ක වන්දි මුදලක් පිරිනැමේ. දිට්වා ආපදාවට පෙර අධි අවදානම් බවට නම්කර ඉවත් වන ලෙස දැනුම් දී ඉවත් නොවී සිටි පවුල් හා ඉවත් නොවන බවට දිවුරුම් ප්‍රකාශ ලබා දී සිටි පවුල් සඳහා ද විශේෂ අවස්ථාවක් සේ සලකා මෙම වන්දි මුදල ලබගැනීමට හිමිකම් ලබනු ඇත. මෙම දිට්වා ආපදා තත්ත්වය හේතුවෙන් පෙර අවදානම් සහිත බව දන්වා තිබු නිවසේ හෝ ඉඩමෙහි ආපදාවේ තීව්‍රතාවය තවදුරටත් වැඩි වුයේ නම් ඔවුන් ද මෙම වන්දි ලබාගැනීමට හිමිකම් ලබයි.

### 11.6.1 දිට්වා සුළි කුණාටුව හේතුවෙන් හානි වූ ඉඩමේ හෝ ප්‍රතිලාභියාට අයත් වෙනත් ඉඩමක නිවසක් ඉදිකර ගැනීම සඳහා රු. 5,000,000/- ක දීමනාව ලබා දීම.

**11.6.1.1** මෙම මුදල පළමු අදියරේ දී රු. 2,000,000/-ක් ද දෙවන අදියරේ දී රු. 1,500,000/-ක් ද හා තෙවන අදියරේදී රු.1,500,000/- ක් ද වශයෙන් නිවාසය ඉදිකිරීමේ ප්‍රගතිය අනුව ප්‍රතිලාභියා වෙත ගෙවිය යුතුය. මෙහිදී, එක් එක් අදියරේදී කළයුතු වැඩ කොටස් ඇමුණුම 19 මගින් දන්වා ඇත.

**11.6.1.2** නිවස ඉදිකිරීමෙන් අනතුරුව මුදල් ඉතිරි වන්නේ නම් එම මුදල් යොදවා නිවසට ආපදා ප්‍රත්‍යස්ථික බැමි, තාප්ප ඉදිකිරීම හෝ ජල හා සනීපාරක්ෂක පහසුකම් සපුරාගැනීම සිදු කළ හැකිය.

**11.6.1.3** වෙනත් ඉඩමක නිවසක් ඉදි කිරීමේදී 03/2026(i) අංක දරණ නැවත පදිංචි කිරීමේ මාර්ගෝපදේශය මගින් ලබා දී ඇති උපදෙස් අනුගමනය කළ යුතුය.

**11.6.1.4** අවම බෙදුම් ඒකකයට වඩා අඩු ඉඩම් කොටසක පදිංචිව සිට නිවස පූර්ණ හානියට පත් වූ පුද්ගලයින් සඳහා නව නිවසක් ඉදිකිරීම වෙනුවෙන් අවම බෙදුම් ඒකකයට සරිලන ඉඩමක් ලබාදීමට කටයුතු කළ යුතුය.

### 11.6.2 ආපදාවන්ට ඔරොත්තු නොදෙන කටුමැටි හා ලෑලි වැනි තාවකාලික අමුද්‍රව්‍ය යොදා සකස් කළ නිවාස සඳහා වන්දි ලබාදීම

ආපදාවන්ට ඔරොත්තු නොදෙන කටුමැටි හා ලෑලි වැනි තාවකාලික අමුද්‍රව්‍ය යොදා සකස් කළ නිවාස දිට්වා සුළි කුණාටුව හේතුවෙන් හානියට පත් වූයේ නම්, මෙවැනි නිවෙස්වලට සිදුවන ආපදා වෙනුවෙන් වරින් වර වන්දි ලබාදීම ප්‍රතිඵලදායක හා ආර්ථික පිරිමැසුම්දායක නොවන බැවින් එම නිවාස නැවත නැවත ආපදාවට ලක්වීම වළක්වාලීම සඳහා මෙම නිවාස ද **පූර්ණ හානි නිවාස ලෙස සලකා** ඇමුණුම 16, 17, 18 පරිදි ආපදා ප්‍රත්‍යස්ථික නිවසක් ලෙස ඉදිකිරීමට රුපියල් ලක්ෂ 50ක වන්දි මුදලක් ලබාදිය යුතුය.

**11.6.2.1** මෙහිදී, පළමු වාරිකය රු. 2,000,000/- ද දෙවන වාරිකය රු.1,500,000/- ද තුන්වන වාරිකය රු.1,500,000/- ද බැගින් වාරික 03ක් යටතේ මෙම රු.5,000,000/-ක මුදල ඉදිකිරීමේ ප්‍රගතිය අනුව ප්‍රතිලාභියා වෙත ලබාදිය යුතුය.

**11.6.3** ආපදා අවස්ථාව වනවිට ඉදිකිරීම් අවසන් කර ඇති එහෙත් පදිංචි නොවූ ප්‍රතිලාභියාට හිමි එකම නිවස (ජීවත් වියහැකි වෙනත් නිවසක අයිතිය ප්‍රතිලාභියා/කලත්‍රයා වෙත නොමැති නම්) ආපදාවෙන් පූර්ණ හානියට පත් වූයේ නම් (ඉහත 11.5.1 පූර්ණ හානි නිර්ණායක අනුව) එම නිවස සඳහා ද හානි තක්සේරුව අනුව උපරිමය රුපියල් 5,000,000/-ක් දක්වා ඉහත 11.6.2.1 පරිදි වාරික 03 ක් මගින් ඉදි කිරීමේ ප්‍රගතිය මත වන්දි මුදල් ලබාදිය හැක.

**11.6.4** නිවස ඉදිකර ගැනීමට ශක්‍යතාවයක් නොමැති වයස්ගත, ආබාධ සහිත හෝ වෙනත් ඕනෑම හේතුවක් මත නිවස ඉදිකරගත නොහැකි පවුල් වෙත ලාභ අපේක්ෂාවෙන් තොරව හා සුභසාධන පරමාර්ථයෙන් පමණක් සමිතියක් මාර්ගයෙන් නිවස ඉදිකරදීමට කටයුතු කළ හැකිය.

**11.6.5** පීඩාවට පත් ජනතාවට කඩිනමින් සහන සැලසීම සඳහා සහ සුරක්ෂිත ජීවන මට්ටමක් ලබාදීම සඳහා මෙම ආපදා අවස්ථාවට පමණක් බලපාන පරිදි රු.5,000,000/- දක්වා දීමනා ගෙවීමේ බලතල ප්‍රාදේශීය ලේකම් වෙත ලබාදෙනු ලැබේ.

**11.6.6** දිට්වා සුළි කුණාටුව හේතුවෙන් පූර්ණ හානි වූ නිවාස වෙනත් ස්ථානයක නැවත ඉදිකිරීමේදී , අංක 03/2026(i) දරන නැවත පදිංචි කිරීමේ මාර්ගෝපදේශය අනුව කටයුතු කළ යුතුය.

**11.7පූර්ණ නිවාස හානි සඳහා නව නිවසක් ඉදි කිරීමට දීමනා ලබා දීමේ දී සපුරාලිය යුතු කරුණු**

**11.7.1** මෙහිදී, අවම වර්ග අඩි 650ක නිවසක්, ග්‍රාමීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුවේ නිර්දේශ මත හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අනුමැතිය හා ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය මත භූමියට සරිලන ලෙස සකස් කර ගැනීමට හැකියාව ඇත. (ඇමුණුම 20 මගින් දක්වා ඇති ගිවිසුමට ප්‍රතිලාභියා එළඹිය යුතුය) නිවසක් ඉදිකිරීමේදී අවම වශයෙන් මේ සමඟ අමුණා ඇති වර්ග අඩි 650ක ආපදා ප්‍රත්‍යස්ථික නිවාස සැලැසුම්වලට අනුකූලව වසරක් තුළ ඉදිකිරීමට කටයුතු කළ යුතුය. (ආපදා ප්‍රත්‍යස්ථික නිවාස සැලසුම් මේ සමඟ ඇමුණුම් අංක 16,17, 18 ලෙස අමුණා ඇත).

**11.7.2** නිවසක් ඉදිකිරීමේදී ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් සහ අනෙකුත් වියදම් ප්‍රතිලාභියා විසින් දැරිය යුතුය.

**11.7.3** රැකියාව හේතුවෙන් හෝ වෙනත් පෞද්ගලික අවශ්‍යතාවයක් මත වෙනත් ස්ථානයක තාවකාලිකව පදිංචි වී සිටියද විදේශ ගත වී සිටියද ස්ථිර පදිංචි හෝ ප්‍රතිලාභියා සතු එකම නිවසට පදිංචිය තහවුරු කරගෙන පූර්ණ හානි වන්දිය ලබාදිය යුතුය. එක් පුද්ගලයෙකුට නිවාස කිහිපයක හිමිකාරිත්වය පවතින අවස්ථාවකදී වන්දි හිමිවන්නේ එක් නිවසක් සඳහා පමණි.

**11.7.4** විදේශිකයන්ට හෝ ද්විත්ව පුරවැසිභාවය හිමි පුද්ගලයින්ට මෙම අයිතිවාසිකම හිමි නොවේ.

11.7.5 අනවසර පදිංචිකරුවන් වෙත මෙම දීමනාව ගෙවනු ලබන විටක එම අනවසර භූමියෙන් පුද්ගලයා ඉවත්කර භූමිය රක්ෂිත භූමියක් ලෙස සංරක්ෂණය කළ යුතුය.

11.7.6 යම්කිසි ප්‍රදේශයක නාය අධි අවදානම නිසා පවුල් ඉවත් කිරීමේදී එම ඉඩම් අතරින් නාය අවදානම නොමැති/මධ්‍ය අවදානම් භූමි ලෙස නිර්දේශ කර ඇති පවුල් අඩු සංඛ්‍යාවක් ඉතිරිවන අවස්ථාවලදී දිස්ත්‍රික් ලේකම් විසින් දිස්ත්‍රික් කමිටුව මගින් සමාජමය ගැටළුවක් ලෙස තීරණය කරන්නේ නම් එම පවුල්ද වෙනත් ස්ථානයක පදිංචි කිරීමට දිස්ත්‍රික් කමිටු තීරණයක් ලබාගෙන කටයුතු කළයුතුය.

## 11.8 අර්ධ නිවාස හානි සඳහා වන්දි ගෙවීම

11.8.1 ආපදා බලපෑම හේතුවෙන් සිදු වූ අර්ධ නිවාස හානියකදී එම හානි වූ නිවස පිළිසකර කර ගැනීම සඳහා නිවස මුලින් පැවැති තත්ත්වය නොසලකා වන්දි මුදල් ලබාදිය යුතුය.

11.8.2 අර්ධ හානි වූ නිවස යථාවත් කර ගැනීම සඳහා හානි තක්සේරුවකින් තොරව වන්දි ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරනු ලබන නිවාස හිමියන් සඳහා රුපියල් 500,000/- මුදලක් ලබා දිය යුතුය.

11.8.3 මෙම මුදලින් රුපියල් 300,000/-ක වාරිකයක් මූලිකව ලබාදී, නිවස ආපදා ප්‍රත්‍යස්ථිකව ප්‍රතිසංස්කරණය කරනු ලබන බවට තහවුරු කර ගැනීමෙන් අනතුරුව ඉතිරි රු.200,000/-ක මුදල නිකුත් කළ යුතුය.

11.8.3.1 පළමු රුපියල් 300,000/- නිකුත් කිරීමේදී ප්‍රතිලාභියාගේ ඉල්ලීම මත මුදල් කඩිනමින් මුදාහැරිය යුතුය.

❖ පහත (අ) සිට (උ) දක්වා වන ඉදිකිරීම් වලින් අවම වශයෙන් එකක් හෝ සිදු කරනු ලබන අර්ධ හානි නිවාසවල ප්‍රතිසංස්කරණය කිරීම් සඳහා පමණක් තක්සේරුවකින් තොරව ගෙවනු ලබන රු. 500,000/- ක දීමනාව හිමිගැන්වේ.

(අ) තම නිවස සඳහා නව ස්ථිර කොටසක් ආපදා ප්‍රත්‍යස්ථික ලෙස ප්‍රතිසංස්කරණ කිරීම හෝ අලුතින් ඉදිකිරීම.

(ආ) මුළුතැන්ගෙය ආපදා ප්‍රත්‍යස්ථික ලෙස ප්‍රතිසංස්කරණ කිරීම හෝ අලුතින් ඉදිකිරීම.

(ඇ) නිවසේ වහලය ස්ථිර ලෙස සකස් කිරීම.

(ඈ) නිවසේ සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කර ගැනීම හෝ අලුතින් ඉදිකිරීම.

(ඉ) නිවස ආපදා ප්‍රත්‍යස්ථික වන පරිදි බැම් හෝ ඉඩමේ සංරක්ෂණ ක්‍රමවේද සකස් කරගැනීම.

(ඊ) ඉදිරියේදී ඇතිවිය හැකි ආපදා අවස්ථාවන්ට ඔරොත්තු දෙන පරිදි අර්ධ හානි වූ නිවස ප්‍රතිසංස්කරණය කිරීම

(උ) ආපදා තත්ත්වය හේතුවෙන් දුර්වර්ණ වූ බිත්ති යථා තත්ත්වයට පත්කිරීම සඳහා තීන්ත ආලේප කිරීම

- ප්‍රතිලාභීන් වෙත ලබාදෙනු ලබන මෙම වන්දි මුදල් භාවිතයෙන් වඩාත් යහපත් හා සුරක්ෂිත ජීවන මට්ටමක් ගොඩනගා ගැනීමට (Build Back Better) ප්‍රතිලාභියා විසින් කටයුතු කළ යුතුය. මෙම ආපදාව හේතුවෙන් නිවසට සිදු වී ඇති හානිය රුපියල් 500,000/-ට අඩු මුදලකින් යතාවත් කළ හැකි වුවද ප්‍රතිලාභියා පදිංචි අර්ධ හානි වූ නිවස වඩාත් සුරක්ෂිත නිවසක් හෝ නිවසේ කොටසක් හෝ ඉහත සඳහන් කුමන හෝ ඉදිකිරීමක් සඳහා මෙම මුදල් භාවිතා කළ හැකිය. ඒ අනුව, ඉදිරියේදී ඇතිවන ආපදා අවස්ථාවන්ට මුහුණදිය හැකි වන අයුරින් නිවස ප්‍රතිසංස්කරණය කිරීම අපේක්ෂා කරන අතර එමගින් ආපදා සහන වෙනුවෙන් ඉදිරියේදී දැරීමට සිදුවන වියදම් අවම කිරීමටත් ජීවිත හා දේපළ ආරක්ෂා කරගැනීමත් අපේක්ෂා කෙරේ.

- ඉහත (අ) සිට (උ) දක්වා කරුණු අතුරින් හානි වූ නිවස ආපදා ප්‍රත්‍යාස්ථිකව ප්‍රතිසංස්කරණ කිරීමට අදාළ ප්‍රතිලාභියාගේ ඉල්ලීම අවශ්‍ය නම් පමණක් තාක්ෂණික නිලධාරීගේ අධීක්ෂණය හා නිර්දේශ යටතේ සිදුකළ යුතුය. මෙම ඉදිකරීම් කටයුතුවලදී තාක්ෂණික නිලධාරි හිඟයක් පවතින බැවින් තාක්ෂණික නිලධාරි සහාය ලබාගැනීම හෝ නොගැනීම තීරණය කිරීමට ප්‍රාදේශීය කමිටුව වෙත බලය පවරනු ලැබේ.

- 300,000/- ක මුදලට අදාළව ප්‍රතිලාභියා විසින් එකඟ වී ඇති ආපදා ප්‍රත්‍යාස්ථික ඉදිකිරීම සිදුකර නොමැතිනම් කමිටුවේ නිරීක්ෂණ මත තවදුරටත් රු.200,000/- ක මුදල ගෙවීම් නොකරන බවට ප්‍රතිලාභියා දැනුවත් කර ලිපියක් යොමු කළ යුතු අතර එසේ මුදල් ගෙවීම් සිදු නොකරන ප්‍රතිලාභී නාමලේඛන පැහැදිලිව පවත්වාගෙන යාම සිදු කළ යුතුය.

**11.8.4** හානි තක්සේරුවකින් පසුව වන්දි ලබාගැනීමට කැමැත්ත ප්‍රකාශ කරන නිවාස හිමියන් සඳහා නිවසට සිදු වි ඇති හානිය තක්සේරු කිරීමෙන් අනතුරුව උපරිමය රුපියල් 2,500,000/- දක්වා වන්දි මුදලක් ලබාදිය යුතුය.

**11.8.4.1** ඉහත (අ) සිට (උ) දක්වා සියලු කොටස් සම්පූර්ණ කර ඇති නිවසක් අධික සුළඟ, අධික වර්ෂාව, ගස් කඩාවැටීම් හේතුවෙන් අර්ධ හානියට පත්වූයේ නම් එම නිවස ආපදා ප්‍රත්‍යාස්ථික බවට පත්කිරීමට තවදුරටත් ප්‍රතිසංස්කරණ සිදුකිරීම අවශ්‍ය නොවන බැවින් සිදු වූ හානිය පමණක් ඇස්තමේන්තු කර ගෙවීමට කටයුතු සිදුකළ හැක.

**11.8.4.2** තක්සේරුගත මුදල රු.300,000/-ක් හෝ ඊට වඩා අඩුවන අවස්ථාවකදී පමණක් තක්සේරු වටිනාකම එකවර ගෙවා අවසන් කළහැක.

**11.8.4.3** තක්සේරුව රු.300,000/- ඉක්මවන අවස්ථාවකදී පළමු අදියර ලෙස තක්සේරුගත මුදලින් 50% ක් ද ඉතිරිය 25% බැගින් අදියර දෙකකින් ඉදිකිරීමේ ප්‍රගතිය අනුව ලබා දීමත් සිදු කළ යුතුය.

**11.8.4.4** හානි තක්සේරුවෙන් අනතුරුව වන්දි ලබාගැනීමට කැමැත්ත ප්‍රකාශ කරන නිවාස හිමියන් සඳහා ඉහත රුපියල් 500,000/-ක වන්දි මුදල හිමි නොවේ.

**11.8.4.5** තක්සේරුවෙන් පසුව රු.500,000/-ට අඩු වන්දියක් හිමිවන ප්‍රතිලාභීන්ට රු.500,000/-ප්‍රතිලාභය ඉල්ලුම් කිරීමට හිමිකමක් නොමැත.

**11.8.5** ආපදා අවස්ථාව වනවිට ඉදිකරමින් පැවැති, ප්‍රතිලාභියාට හිමි එකම නිවස (ජීවත් වියහැකි වෙනත් නිවසක අයිතිය ප්‍රතිලාභියා/කලත්‍රයා වෙත නොමැති) ආපදාවෙන් හානියට පත් වූයේ නම් එම නිවස සඳහා ද හානි තක්සේරුව අනුව

(ඉහත 11.5.2 අර්ධ හානි නිර්ණායක අනුව) උපරිමය රුපියල් 2,500,000/-ක් දක්වා වාරික 03 ක් මගින් ඉදි කිරීමේ ප්‍රගතිය මත වන්දි මුදල් ලබාදිය හැක.

**11.8.6** ප්‍රතිලාභීන් වෙත පදිංචිය තහවුරු කරගෙන නිවාස හානි වන්දි ලබාදිය යුතුය. එක් පුද්ගලයෙකුට නිවාස කිහිපයක හිමිකාරීත්වය පවතින අවස්ථාවකදී වන්දි හිමිවන්නේ එක් නිවසක් සඳහා පමණි.

**11.8.7** පීඩාවට පත් ජනතාවට කඩිනමින් සහන සැලසීම සඳහා සහ සුරක්ෂිත ජීවන මට්ටමක් ලබාදීම සඳහා මෙම ආපදා අවස්ථාවට පමණක් බලපාන පරිදි රු.2,500,000/- දක්වා වන්දි මුදල් ගෙවීමේ බලතල ප්‍රාදේශීය ලේකම් වෙත ලබාදෙනු ලැබේ.

**11.8.8** රක්ෂිත හෝ අනවසර ස්ථානවල පදිංචිකරුවන් අර්ධ හානි වෙනුවෙන් වන්දි ලබාගැනීමට හිමිකම් නොලබයි .

**11.8.9** රක්ෂිතවල හෝ අනවසර ස්ථානවල පදිංචිකරුවන්ගේ පූර්ණ හානි වූ නිවාස හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින් නායයෑම් අධි අවධානම් ලෙස නිර්දේශ ලබා දී ඇති රක්ෂිතවල හෝ අනවසර ස්ථානවල පදිංචිකරුවන්ගේ නිවාස පූර්ණ හානි ලෙස සලකා රු. 5,000,000/- ක නිවාස හිමිකම් ලබාදෙනු ලැබුවද රක්ෂිත හෝ අනවසර ඉඩම්වල පදිංචිකරුවන් සඳහා අර්ධ නිවාස හානි සඳහා රු.500,000/- ක ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වන දීමනාව ලබා දෙනු නොලැබේ.

## 11.9 නිවාස හානි වන්දි ගෙවීම සඳහා අවශ්‍ය ලේඛන

### 11.9.1 පූර්ණ නිවාස හානි වන්දි ගෙවීම

(අ.) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (NDRSC 3 ආකෘති පත්‍රය) - ඇමුණුම 21

(ආ.) අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත/ රියදුරු බලපත්‍රය/ වැඩිහිටි හැඳුනුම්පත/ විදේශ ගමන් බලපත්‍ර පිටපත

(ඇ.) හානියට පත් දේපළෙහි පැහැදිලි ඡායාරූප 04ක් (දිශානතීන් හතරකින් දේපළ හානිය සනාථ වන පරිදි)

(ඈ) භූමිය පිළිබඳව ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ ආපදා ප්‍රත්‍යක්ෂීක වාර්තාව -

නායයෑම්/පස් කණ්ඩි කඩාවැටීම් හේතුවෙන් හානියට පත් නිවාස සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාර්තා ලබාගැනීම අනිවාර්යය වේ. ගංවතුර, ගස්කඩා වැටීම්, සුළඟ හේතුවෙන් වන ආපදා සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාර්තා ලබාගැනීම අවශ්‍ය නොවේ. නායයෑම් අවදානම පවතින ප්‍රදේශවල පමණක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාර්තා ලබාගත යුතුව ඇත.ගංවතුර පිටාර ජලය ආශ්‍රිත නිරන්තර පීඩාවට පත්වන ප්‍රදේශවල නැවත පදිංචි කිරීමේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැනි තාක්ෂණික ආයතන මගින් ආපදාවට අනුගතවන නිවාස ඉදිකිරීම සඳහා යෝජිත තාක්ෂණික උපදෙස් ලබාගැනීමට කටයුතු කළ හැකිය.
උදා: නිරන්තර ගංවතුරට යට නොවන මට්ටමකට නිවස උස්කර ඉදිකිරීමට අවශ්‍ය වන මට්ටම් හඳුනා ගැනීම.

මෙම වාර්තා ලබාගැනීමේ අපහසුතා පවතින අවස්ථාවල ප්‍රාදේශීය කමිටුව හෝ ප්‍රාදේශීය ලේකම් විසින් එම වාර්තා නොමැතිව වුවද කටයුතු කිරීමට තීරණය කළ හැකිය.

ආපදාවේ ස්වභාවය අනුව, නිර්දේශ ලබාගැනීම අවශ්‍ය වන බවට ප්‍රාදේශීය ලේකම් විසින් තීරණය කරනු ලබන අවස්ථාවක අදාළ ආයතන වලින් නිර්දේශ ලබාගැනීම සිදුකළ හැකිය.

(ඉ.) දේපළ අයිතිය සනාථ කෙරෙන ලියවිලි, ඔප්පු පිටපත් ආදිය

(ඊ.) ග්‍රාමීය ආපදා කළමනාකරණ සහ සහන සේවා කමිටුවේ නිර්දේශය සහ ප්‍රාදේශීය ලේකම් අනුමැතිය.

(උ.) ඔප්පුවේ නම් සඳහන් අයිතිකරුගේ නමින්ම ප්‍රතිපාදන ඉල්ලුම් නොකරන්නේ නම් ඥාතීත්වය සනාථ කිරීමට ග්‍රාම නිලධාරි විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන හා නිල මුද්‍රාව සහිත ලිපිය.

(ඌ.) මෙහිදී, පූජාභූමි හා වෙනත් ආයතන සතු ඉඩම් සඳහා එම ඉඩම් හිමිකරුගේ එකඟතාවය මත නිවස ඉදිකිරීමට වන්දි මුදල් ලබාදිය හැකිය.

### 11.9.2 අර්ධ නිවාස හානි වන්දි ගෙවීම

(අ.) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (NDRSC 3 ආකෘති පත්‍රය) - ඇමුණුම 21

(ආ.) අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත/ රියදුරු බලපත්‍රය/ වැඩිහිටි හැඳුනුම්පත/ විදේශ ගමන් බලපත්‍ර පිටපත

(ඇ.) හානියට පත් දේපළෙහි පැහැදිලි ඡායාරූප 04ක් (දිශානතීන් හතරකින් දේපළ හානිය සනාථ වන පරිදි)

(ඈ) භූමිය පිළිබඳව ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ ඇතුළත් වාර්තාව

නායයෑම්/පස් කණ්ඩි කඩාවැටීම් හේතුවෙන් හානියට පත් නිවාස සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාර්තා ලබාගැනීම අනිවාර්යය වේ. ගංවතුර, ගස්කඩා වැටීම්, සුළඟ හේතුවෙන් වන ආපදා සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාර්තා ලබාගැනීම අවශ්‍ය නොවේ. නායයෑම් අවදානම පවතින ප්‍රදේශවල පමණක් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාර්තා ලබාගත යුතුව ඇත.ගංවතුර පිටාර ජලය ආශ්‍රිත නිරන්තර පීඩාවට පත්වන ප්‍රදේශවල නැවත පදිංචි කිරීමේදී වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැනි තාක්ෂණික ආයතන මගින් ආපදාවට අනුගතවන නිවාස ඉදිකිරීම සඳහා යෝජිත තාක්ෂණික උපදෙස් ලබාගැනීමට කටයුතු කළ හැකිය.

මෙම වාර්තා ලබාගැනීමේ අපහසුතා පවතින අවස්ථාවල ප්‍රාදේශීය කමිටුව හෝ ප්‍රාදේශීය ලේකම් විසින් එම වාර්තා නොමැතිව වුවද කටයුතු කිරීමට තීරණය කළ හැකිය.

ආපදාවේ ස්වභාවය අනුව, නිර්දේශ ලබාගැනීම අවශ්‍ය වන බවට ප්‍රාදේශීය ලේකම් විසින් තීරණය කරනු ලබන අවස්ථාවක අදාළ ආයතන වලින් නිර්දේශ ලබාගැනීම සිදුකළ හැකිය.

(ඉ.) දේපළ අයිතිය සනාථ කෙරෙන ලියවිලි, ඔප්පු පිටපත් ආදිය

(ඊ.) ප්‍රාදේශීය ලේකම් කාර්යාල තක්සේරු කමිටු වාර්තාව සහ අනුමැතිය. (තක්සේරුවෙන් පසුව වන්දි ගෙවීම සිදුකළ යුතු නිවාස හා දේපළ හානි සඳහා පමණි)

(ඥ) ඔප්පුවේ නම් සඳහන් අයිතිකරුගේ නමින්ම ප්‍රතිපාදන ඉල්ලුම් නොකරන්නේ නම් ඥාතීත්වය සනාථ කිරීමට ග්‍රාම නිලධාරි විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන හා නිල මුද්‍රාව සහිත ලිපිය.

## 12. ව්‍යාපාරික හානි සඳහා ගෙවීම් සිදුකිරීම

විස්තීර්ණ ආපදා තත්ත්වය හේතුවෙන් ආපදාවට ලක්ව ව්‍යාපාර කටයුතු ඇණහිට ඇති තනි, සුළු හා ක්ෂුද්‍ර ව්‍යාපාර යථාවත් කිරීම වෙනුවෙන් ව්‍යාපාර හිමියන් සඳහා දීමනා ලබාදීම මෙ යටතේ ආවරණය වේ.

**12.1** මෙහිදී, ව්‍යාපාර වර්ගීකරණය සඳහා කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 2025/02 දිනැති කර්මාන්ත චක්‍රලේඛ 2025.12.08 මගින් ලබා දී ඇති පහත නිර්ණායක භාවිතා කළ යුතුය.

| අංශය | නිර්ණායක | සුළු | ක්ෂුද්‍ර |
|---|---|---|---|
| නිෂ්පාදන අංශය | වාර්ෂික පිරිවැටුම | රු.මිලියන 20 – 350 | රු.මිලියන 20ට අඩු |
| | සේවක සංඛ්‍යාව | 10-50 | 10ට අඩු |
| සේවා අංශය | වාර්ෂික පිරිවැටුම | රු.මිලියන 20 – 350 | රු.මිලියන 20ට අඩු |
| | සේවක සංඛ්‍යාව | 5-50 | 5ට අඩු |

### 12.2 ආපදා තත්ත්වය හේතුවෙන් හානි වී ඇති ස්ථිර ව්‍යාපාරික ගොඩනැගිලි හිමි ව්‍යාපාර හිමියන් සඳහා වන්දි ලබාදීම

**12.2.1** ආපදා තත්ත්වය හේතුවෙන් හානි වී ඇති ස්ථිර ව්‍යාපාරික ගොඩනැගිලි සඳහා ව්‍යාපාර ගොඩනැගිලි හිමියෙකුට නැවත තම ව්‍යාපාරික ස්ථානය යථාවත් කිරීමට හා නැවත ආරම්භ කිරීමට සුදුසු තත්ත්වයට පත් කිරීම සඳහා ස්ථිර ව්‍යාපාරික ගොඩනැගිල්ලට සිදුව ඇති හානි වෙනුවෙන් පහත පරිදි වන්දි මුදල් ලබාදෙනු ලැබේ.

**12.2.1.1** හානි වී ඇති ව්‍යාපාර ගොඩනැගිලි වෙනුවෙන් ගොඩනැගිල්ල යථාවත් කර ගැනීම සඳහා හානි තක්සේරුවකින් තොරව වන්දි ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරනු ලබන ව්‍යාපාර හිමියන් සඳහා රුපියල් 500,000/-ක මුදලක් ලබා දිය යුතුය.

**12.2.1.2** මෙම මුදලින් රුපියල් 300,000/-ක වාරිකයක් මූලිකව ලබාදී, ව්‍යාපාරික ස්ථානය ආපදා ප්‍රත්‍යස්ථීකව ප්‍රතිසංස්කරණය කරනු ලබන බවට තහවුරු කර ගැනීමෙන් අනතුරුව ඉතිරි රුපියල් 200,000/-ක මුදල නිකුත් කළ යුතුය.

300,000/- ක මුදලට අදාළව ප්‍රතිලාභියා විසින් එකඟ වී ඇති ආපදා ප්‍රත්‍යස්ථීක ඉදිකිරීම සිදුකර නොමැතිනම් කමිටුවේ නිරීක්ෂණ මත තවදුරටත් රු.200,000/- ක මුදල ගෙවීම් නොකරන බවට ප්‍රතිලාභියා දැනුවත් කර ලිපියක් යොමු කළ යුතු අතර එසේ මුදල් ගෙවීම් සිදු නොකරන ප්‍රතිලාභී නාමලේඛන පැහැදිලිව පවත්වාගෙන යාම සිදු කළ යුතුය.

**12.2.2** පහත (අ) සිට (උ) දක්වා වන ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම්වලින් අවම වශයෙන් එකක් හෝ සිදු කරනු ලබන ස්ථිර ව්‍යාපාරික ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම් සඳහා පමණක් ඉහත 12.2.1.1 හි සඳහන් තක්සේරුවකින් තොරව ගෙවනු ලබන රුපියල් 500,000/-ක දීමනාව හිමිගැන්වේ.

(අ) තම ස්ථිර ව්‍යාපාරික ගොඩනැගිල්ල සඳහා නව ස්ථිර කොටසක් ආපදා ප්‍රත්‍යස්ථික ලෙස ප්‍රතිසංස්කරණ කිරීම හෝ අලුතින් ඉදිකිරීම.

(ආ) තම ව්‍යාපාරික ගොඩනැගිල්ලෙහි වහලය ස්ථිර ලෙස සකස් කිරීම.

(ඇ) ස්ථිර ව්‍යාපාරික ගොඩනැගිල්ලෙහි සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කර ගැනීම හෝ අලුතින් ඉදිකිරීම.

(ඈ) ව්‍යාපාරික ගොඩනැගිල්ල ආපදා ප්‍රත්‍යස්ථික වන පරිදි බැම් හෝ ඉඩමේ සංරක්ෂණ ක්‍රමවේද සකස් කරගැනීම.

(ඉ) ඉදිරියේදී ඇතිවිය හැකි ආපදා අවස්ථාවන්ට ඔරොත්තු දෙන පරිදි හානි වූ ස්ථිර ව්‍යාපාරික ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම.

(උ) ආපදා තත්ත්වය හේතුවෙන් දුර්වර්ණ වූ බිත්ති යථා තත්ත්වයට පත්කිරීම සඳහා තීන්ත ආලේප කිරීම

**12.2.3** මෙම ආපදාව හේතුවෙන් ව්‍යාපාරික ස්ථානයට සිදු වී ඇති හානිය රුපියල් 500,000/-ට අඩු මුදලකින් යතාවත් කළහැකි වුවද ප්‍රතිලාභියාගේ හානියට පත් ස්ථිර ව්‍යාපාරික ගොඩනැගිල්ල ප්‍රමිතිගතව ඉදිකර නොමැතිනම් වඩාත් සුරක්ෂිත ස්ථිර ව්‍යාපාරික ගොඩනැගිල්ලක් හෝ ව්‍යාපාරික ගොඩනැගිල්ලේ කොටසක් හෝ ඉදිකිරීම සඳහා මෙම මුදල් භාවිතා කළ හැකිය. එමගින් ඉදිරියේදී ඇතිවන ආපදා අවස්ථාවන්ට මුහුණදිය හැකි වන අයුරින් ස්ථිර ව්‍යාපාරික ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම අපේක්ෂා කරන අතර එමගින් ආපදා සහන වෙනුවෙන් ඉදිරියේදී දැරීමට සිදුවන වියදම් අවම කිරීම අපේක්ෂා කෙරේ.

හානි වූ ව්‍යාපාරික ස්ථානය ආපදා ප්‍රත්‍යස්ථිකව ඉදිකිරීමට අදාළව ඉහත (අ) සිට (උ) දක්වා කරුණු අනුව සිදු කිරීමට අපේක්ෂිත ප්‍රතිසංස්කරණ කාර්යය, ප්‍රතිලාභියාගේ ඉල්ලීම හා තාක්ෂණික නිලධාරිගේ අධීක්ෂණය හා නිර්දේශ අනුව සිදුකළ හැකිය.

මෙහිදී, ලබාදෙනු ලබන රුපියල් 500,000/-ක මුදල යොදාගනිමින් ව්‍යාපාරික ස්ථානය ආපදා ප්‍රත්‍යස්ථිකව ඉදිකිරීමට/ප්‍රතිසංස්කරණය කිරීමට අදාළව සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන් පිළිබඳව ප්‍රතිලාභියා විසින් අයදුම්පත්‍රයෙහි පැහැදිලිව සඳහන් කළයුතු අතර ඒ අනුව එම කාර්යයන් සිදු කිරීමට අදාළ උපදෙස් ග්‍රාමීය ආපදා කළමනාකරණ හා සහන සේවා කමිටුව විසින් ලබාදෙනු ඇත.

ඉහත (අ) සිට (උ) දක්වා සියලු කොටස් සම්පූර්ණ කර ඇති ව්‍යාපාර ගොඩනැගිල්ලක් අධික සුළඟ, අධික වර්ෂාව, ගස් කඩාවැටීම් හේතුවෙන් අර්ධ හානියට පත්වූයේ නම් එම ව්‍යාපාරික ගොඩනැගිල්ල ආපදා ප්‍රත්‍යස්ථික බවට පත්කිරීමට තවදුරටත් ප්‍රතිසංස්කරණ සිදුකිරීම අවශ්‍ය නොවන බැවින් එම හානිය පමණක් ඇස්තමේන්තු කර ගෙවීම් කිරීමට කටයුතු සිදුකළ හැක.

**12.2.4** හානි තක්සේරුවකින් පසුව වන්දි ලබාගැනීමට කැමැත්ත ප්‍රකාශ කරන ව්‍යාපාර හිමියන් සඳහා ව්‍යාපාරික ගොඩනැගිල්ලට සිදු වී ඇති හානිය තක්සේරු කිරීමෙන් අනතුරුව උපරිමය රුපියල් 5,000,000/- දක්වා වන්දි මුදලක් ලබාගත හැකිය.

තක්සේරුගත මුදල රු. 300,000/-ක් හෝ ඊට වඩා අඩුවන අවස්ථාවකදී පමණක් තක්සේරු වටිනාකම එකවර ගෙවා අවසන් කළහැක.

තක්සේරු අගය රු.300,000/- ඉක්මවන අවස්ථාවකදී තක්සේරුගත මුදලින් 50%ක් පළමු වාරිකය ලෙස ද ඉතිරිය 25% බැගින් වූ වාරික 02ක් මගින් ඉදිකිරීමේ ප්‍රගතිය අනුව ගෙවා අවසන් කළ යුතුය.

**12.2.5** හානි තක්සේරුවෙන් අනතුරුව වන්දි ලබාගැනීමට කැමැත්ත ප්‍රකාශ කරන ව්‍යාපාර හිමියන් සඳහා ඉහත රුපියල් 500,000/-ක වන්දි මුදල හිමි නොවේ.

**12.2.6** අනවසර භූමියක පිහිටි ව්‍යාපාරික ගොඩනැගිලි සඳහා මෙම වන්දි මුදල් හිමි නොවේ.

**12.2.7** හානියට පත් ව්‍යාපාරික ගොඩනැගිල්ල පිහිටි භූමිය අධි අවදානම් බවට ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශ ලැබී ඇති විට එම ව්‍යාපාරික ගොඩනැගිල්ල හිමි පුද්ගලයාට වෙනත් ආපදා ප්‍රත්‍යස්ථික භූමියක ව්‍යාපාරික ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා හෝ නව ව්‍යාපාරික ගොඩනැගිල්ලක් මිලදී ගැනීම සඳහා හෝ රු. 5,000,000/-ක වන්දි මුදලක් ගොඩනැගිලිහිමියා වෙත ලබාදිය යුතුය. නව ව්‍යාපාරික ගොඩනැගිල්ල ඉදිකරන/මිලදී ගනු ලබන භූමිය ආපදා ප්‍රත්‍යස්ථික භූමියක් බවට වාර්තාවක් ලබාගත යුතුය. ව්‍යාපාරික ගොඩනැගිල්ල ඉදිකිරීමේදී හෝ මිලදී ගැනීමකදී ගෙවිය යුතු ව්‍යවස්ථාපිත ගෙවීම් සහ අනෙකුත් වියදම් ප්‍රතිලාභියා විසින් දැරිය යුතුය.

**12.2.7.1** හානි වූ ඉඩමේ හෝ ප්‍රතිලාභියාට අයත් වෙනත් ඉඩමක ව්‍යාපාරික ස්ථානය ඉදිකර ගැනීම සඳහා රු. 5,000,000/- ක දීමනාව ලබා දීම.

මෙම මුදල පළමු අදියරේ දී රු. 2,000,000/-ක් ද දෙවන අදියරේ දී රු. 1,500,000/-ක් ද හා තෙවන අදියරේදී රු.1,500,000/- ක් ද වශයෙන් ව්‍යාපාරික ගොඩනැගිල්ල ඉදිකිරීමේ ප්‍රගතිය අනුව ප්‍රතිලාභියා වෙත ගෙවිය යුතුය.

**12.2.7.2** ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාමට සුදුසු ගොඩනැගිල්ලක් මිලදී ගැනීමට රු. 5,000,000/- ක් දක්වා දීමනාවක් එකවර ලබා දීම.

**12.2.8** මෙම වන්දි මුදල් ලබාදීමේදී ග්‍රාම නිලධාරි, පරිපාලන ග්‍රාම නිලධාරි, කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරි, ජාතික එළදායිතා ලේකම් කාර්යාල නිලධාරි, කාර්මික සංවර්ධන මණ්ඩල නිලධාරි, ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන නිලධාරි, සමාජ සේවා නිලධාරි හෝ අදාළ අනෙකුත් නිලධාරීන්ගේ සහාය ලබාගත යුතුය.

**12.2.9** ව්‍යාපාර ගොඩනැගිල්ල යථාවත් කිරීම සඳහා රුපියල් 500,000/-ක වන්දි මුදල ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළයුතු ලේඛන පහත පරිදි වේ.

- සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (NDRSC 3.8 Business ආකෘති පත්‍රය) - ඇමුණුම 22
- ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකය
- වෙළඳ බලපත්‍රය
- ව්‍යාපාරය පවත්වාගෙන යාමට බලයලත් ආයතනවලින් ලබාගෙන ඇති ලියවිලි
- අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත / රියදුරු බලපත්‍රය / වැඩිහිටි හැඳුනුම්පත/ විදේශ ගමන් බලපත්‍ර පිටපත
- හානියට පත් ව්‍යාපාර ස්ථානයෙහි පැහැදිලි ඡායාරූප 04ක්
- දේපළ අයිතිය සනාථ කෙරෙන ලියවිලි, ඔප්පු පිටපත්,රජයේ ඉඩමක් නම් ප්‍රාදේශීය ලේකම්ගේ එකඟතාවය

**12.2.10** හානි තක්සේරුවකින් අනතුරුව ලබාදෙනු ලබන රුපියල් 5,000,000/- දක්වා වන්දි මුදල් ලබා ගැනීමට අවශ්‍ය ලේඛන

- සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය (NDRSC 3.8 Business ආකෘති පත්‍රය) - ඇමුණුම 22
- ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ සහතිකය
- වෙළඳ බලපත්‍රය
- ව්‍යාපාරය පවත්වාගෙන යාමට බලයලත් ආයතනවලින් ලබාගෙන ඇති ලියවිලි
- අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත/රියදුරු බලපත්‍රය/වැඩිහිටි හැඳුනුම්පත/ විදේශ ගමන් බලපත්‍ර පිටපත
- හානියට පත් ව්‍යාපාර ස්ථානයෙහි පැහැදිලි ඡායාරූප 04ක්
- දේපළ අයිතිය සනාථ කෙරෙන ලියවිලි, ඔප්පු පිටපත්, රජයේ ඉඩමක් නම් ප්‍රාදේශීය ලේකම්ගේ එකඟතාවය
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල තක්සේරු කමිටු වාර්තාව සහ අනුමැතිය
- ව්‍යාපාරික ගොඩනැගිල්ල පිහිටි භූමිය සම්බන්ධව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ නිර්දේශ ඇතුළත් වාර්තාව (සිදු වී ඇති ආපදාවේ ස්වභාවය අනුව අවශ්‍යතාවය පරිදි මෙම වාර්තාව ලබාගැනීම සිදු කළහැක)
- නාය අධි අවදානම් තත්ත්වය හේතුවෙන් වෙනත් භූමියක ව්‍යාපාරික ගොඩනැගිල්ල ඉදිකිරීමට /මිලදී ගැනීමට අදාළ ගිවිසුම්පත්‍රය

**12.3** **ආපදාව හේතුවෙන් බලපෑමට ලක් ව ඇති ව්‍යාපාර නැවත ආරම්භ කිරීමට සුදුසු තත්ත්වයට පත් කිරීම සඳහා එක්වරක් පමණක් ලබාදෙනු ලබන දීමනාව පහත පරිදි ලබාදෙනු ලැබේ.**

- මෙහිදී, ආපදාව හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාරය නැවත ආරම්භ කිරීම සඳහා යථාවත් කිරීමේ කටයුතු වෙනුවෙන් ආපදා අවස්ථාව වනවිට ව්‍යාපාරය පවත්වාගෙන යනු ලැබූ ව්‍යාපාර හිමියා වෙත මෙම දීමනාව හිමි වේ.

- ආපදාවට පත් වූ ව්‍යාපාරික ගොඩනැගිල්ල කුලී පදනමින් ලබාගෙන ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර හිමියෙකුගේ ව්‍යාපාරය බලපෑමට ලක්වූයේ නම් මෙම දීමනාව එම ව්‍යාපාර හිමියාට හිමිවන අතර එකී ආපදාව හේතුවෙන් ගොඩනැගිල්ලට සිදු වූ හානිය සඳහා ගොඩනැගිලි හිමියාට ඉහත 12.2.1.1 හෝ 12.2.4 යටතේ වන්දි මුදල් ඉල්ලුම් කළ හැකිය.

- භාණ්ඩ මිලදී ගැනීමේ බිල්පත්, ව්‍යාපාරයට අදාළව ණය ලබාගෙන ඇතිනම් අදාළ ලියවිලි, ව්‍යාපාරයේ නමින් ගෙවන ලද ජල බිල්පත් / විදුලි බිල්පත් ආදිය මගින් ආපදා

අවස්ථාව වනවිට ව්‍යාපාර කටයුතු කරගෙන යන ලද බවට ප්‍රතිලාභියා විසින් තහවුරු කළ යුතුය.

- කර්මාන්ත අමාත්‍යාංශයේ ලියාපදිංචි හානියට පත් ව්‍යාපාර සඳහා ආපදා අවස්ථාව වන විට කර්මාන්ත අමාත්‍යාංශයේ ලියාපදිංචි වී ව්‍යාපාර කටයුතු කරගෙන යන ලද බවට කුඩා ව්‍යාපාර සංවර්ධන නිලධාරි, ජාතික එළදායිතා ලේකම් කාර්යාල නිලධාරි, කාර්මික සංවර්ධන මණ්ඩල නිලධාරි, ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන නිලධාරි, හෝ අදාළ නිලධාරියෙකු මගින් නිර්දේශ ලබාගත යුතුය.

- NDRSC 3.9 අයදුම්පත්‍රය (ඇමුණුම 23) මගින් අදාළ වන්දි මුදල් ඉල්ලුම් කළ හැකිය.

**ව්‍යාපාරයේ ස්වභාවය අනුව හිමිවන දීමනාව පහත පරිදි වේ.**

| | සහනය | දීමනාව |
|---|---|---|
| **12.3.1** | කර්මාන්ත අමාත්‍යාංශයේ ලියාපදිංචි තනි, සුළු හා ක්ෂුද්‍ර ව්‍යාපාර සඳහා | ඒකකයකට රුපියල් 200,000/- |
| **12.3.2** | ව්‍යාපාරයක් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි තනි, සුළු හා ක්ෂුද්‍ර ව්‍යාපාර සඳහා | ඒකකයකට රුපියල් 200,000/- |
| **12.3.3** | ව්‍යාපාරයක් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි නොවූ ගෘහස්ථව ස්ථිර ගොඩනැගිල්ලක පවත්වාගෙන යන වෙළඳ ව්‍යාපාර සඳහා | ඒකකයකට රුපියල් 50, 000/- |
| **12.3.4** | හානියට පත් වූ ලියාපදිංචි නොවූ නිෂ්පාදන කර්මාන්ත හා හරිතාගාර යනාදිය සඳහා | ඒකකයකට රුපියල් 50,000/- |
| **12.3.5** | පදික සහ ජංගම ඇතුළු තාවකාලිකව සිදුකරනු ලබන වෙළඳාම් සඳහා | ඒකකයකට රුපියල් 25,000/- |

